IPRC/24/05 Social Sciences and Humanities

# වැඩිහිටි ප්‍රජාවේ ජීවන තිරසරභාවය කෙරෙහි බලපා ඇති සමාජ-ආර්ථික ගැටලු හා අභියෝගඃ ශ්‍රී ලංකාවේ දකුණු පළාත ඇසුරෙන්

**පි.සි. හෙට්ටිආරච්චි[1*], කේ.එම්.ජී. අමරතුංග[1]**

[1]සමාජවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

වැඩිහිටි ජනගහන වර්ධනය වනාහි ගෝලීය සංසිද්ධියක් වන අතර එය සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවත්නා සෑම රාජ්‍යක්ම මුහුණ දී ඇති සමාජ ගැටලුවකි. ශ්‍රී ලංකාව තුළ වැඩිහිටි ජනගහනය ආසියානු කලාපයේ සමහර රටවල් පවා අබිභවමින් සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් තිබේ. ලාංකේය සමාජයේ මීට අදාළව දැකිය හැකි සුවිශේෂී ගැටළුවක් නම් වැඩිහිටි ජනගහනයේ වර්ධනයට සාපෙක්ෂව සමාජ-ආර්ථික වර්ධනයක් සිදු නොවීමයි. මේ හේතුවෙන් වැඩිහිටියන් සමාජ-ආර්ථික ගැටලු හා අභියෝග රැසකට මුහුණ දී සිටිති. මෙම පර්යේෂණයේ පරමාර්ථය වූයේ වැඩිහිටි ප්‍රජාව මුහුණ දෙන සමාජ-ආර්ථික ගැටලු හඳුනාගනිමින් එම ප්‍රජාවේ ජීවන තිරසාරභාවය කෙරෙහි ගළපාගත හැකි නව ප්‍රවේශතා හා උපායමාර්ග නිර්දේශ කිරීමයි. පර්යේෂණ ක්‍රමවේදය මිශ්‍ර ක්‍රමවේදාත්මක විය. සරල සසම්භාවී නියැදි ක්‍රමය අනුව දකුණු පළාත තුළින් තෝරාගත් වැඩිහිටියන් 350ක නියැදියක් මෙම සඳහා යොදාගනු ලැබිණ. මෙහි දී අනුගමනය කළ පර්යේෂණ විධික්‍රමය සමීක්ෂණ හා ප්‍රත්‍යෙයික විධික්‍රමය විය. ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර භාවිතයෙන් දත්ත රැස්කිරීම සිදු විය. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේශණය සඳහා විස්තරාත්මක සංඛ්‍යානයත්, ගුණාත්මක දත්ත විශ්ලේශණය සඳහා තේමා හා සිද්ධි විශ්ලේශණයත් භාවිතා විය. මෙහි දී තවදුරටත් තිරසාර ජීවිකා වෘත්තී රාමුව ගළපා ගනිමින් වැඩිහිටියන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය තක්සේරුකර ගැණුනි. පර්යේෂණ සොයාගැනීම් අනුව මූල්‍ය, සමාජ ප්‍රාග්ධන විහිනතාවයන් හේතුවෙන් වැඩිහිටි ප්‍රජාවේ ජීවන තිරසරභාවයට සෘණාත්මක බලපෑමක් සිදු වී තිබෙන බව පැහැදිලි විය. ආර්ථික අනාරක්ෂිතභාවය වැඩිහිටි ප්‍රජාවේ ප්‍රමුඛ ගැටලුව බවට පත්වී ඇත. මුළු නියැදියෙන් 35.0%ක ප්‍රතිශතයක් කිසිදු මාසික ආදායමක් නොමැති වැඩිහිටියන්ය. සමාජ ප්‍රාග්ධනය අවම වීම තුලින් වැඩිහිටියන් අතර හුදෙකලාභාවය වර්ධනය වී ඇත. භෞතික පහසුකම් හිඟය, ප්‍රවාහන දුෂ්කරතා, නව තාක්ෂණික අනවබෝධය, සෞඛ්‍ය ගැටලු යනාදී භෞතික හා මානව ප්‍රාග්ධන විහිනතාවයන් වැඩිහිටි ප්‍රජාවේ ජීවන ගැටලු තීව්‍ර කෙරෙන සාධකයන් වී ඇත. නියැදියෙන් 55.0%ක ප්‍රතිශතයක් සෞඛ්‍ය තත්ත්වය දුර්වල වැඩිහිටියන් බව තහවුරු විය. වැඩිහිටියන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය තක්සේරු කොට ගනිමින් ප්‍රාග්ධන ප්‍රවේශතා සඳහා අවකාශය සැපයෙන මැදිහත්වීම් තුළින් වැඩිහිටි ප්‍රජාවේ ජීවන තිරසරභාවය යථාර්තයක් බවට කරගැනීමට හැකියාව ලැබේ.

**මුඛ්‍ය පද:** ආර්ථික අනාරක්ෂිතභාවය, වැඩිහිටි ප්‍රජාව, සමාජ හුදෙකලාභවය, සමාජ-ආර්ථික ගැටළු, ජීවන තිරසරභාවය

*hettipriya250@gmail.com
ORCiD ID: https://orcid.org/0009-0004-2519-4355